// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2356/43 - 2023 නොවැම්බර් මස 05 වැනි ඉරිදා - 2023.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති යටතේ පනවනු ලබන නියෝගය

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා ලෙස රොෂාන් රණසිංහ වන මා හට පැවරී ඇති බලතල අනුව, 2022 ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ T20 ලෝක කුසලානය (පිරිමි) ක්‍රිකට් තරගාවලිය ආශ්‍රිත විශේෂ විගණන වාර්තාව මගින් හෙළිදරව් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුව විසින් සිදු කරනු ලැබ ඇති දූෂණ, විෂමාචාර, අක්‍රමිකතා සහ යුතුකම් සහ වගකීම් ඉටුකිරීම් පැහැර හැරීම් සම්බන්ධයෙන් විමර්ශනය කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය හෙයින්, සහ අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ස්වාධීනව විනිවිදභාවයකින් යුතුව සහ විශ්වාසනීය ලෙස ඉටුකිරීමට අවකාශ සලසා දීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලියාපදිංචිය 2023.11.05 දින සිට අත්හිටුවනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ බලතල කාර්ය හා කර්තව්‍යය නිසි පරිදි සහ කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 33 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රිකට් ක්‍රීඩාව සඳහා ජාතික සංගමයවන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණයක් පවත්වන තෙක් හෝ නැවත දැනුම් දෙන තුරු පවත්වාගෙන යාම සඳහා 2023.11.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත අන්තර් පාලන මණ්ඩලය පත්කළ බව මෙයින් දන්වා සිටිමි.

(1) විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස්. අයි. ඉමාම්
(2) විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු රෝහිණී මාරසිංහ
(3) විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අයිරාංගනී පෙරේරා
(4) අර්ජුන රණතුංග (සභාපති)
(5) එච්. කේ. උපාලි ධර්මදාස
(6) නීතිඥ රකිත නිර්මල රාජපක්ෂ
(7) එම්. එච්. ජමල්ඩීන්

වර්තමානයේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පිළිබඳව මහජනතාව තුළ විශ්වාසය කඩවී ඇති බව පෙනීයන හෙයින් සහ ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් අපකීර්තියට පත්වීමට කරුණු යෙදී ඇති හෙයින් ද, ඊට ප්‍රතිකර්ම සැලසීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරනු ලැබීමට ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති වගකීම ඉටු කරලීම සඳහා ක්‍රීඩා නීතියට සහ මූලික නීති මූලධර්මයන්ට අනුව ක්‍රියාකරමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ යථෝක්ත අක්‍රමිකතා පිළිබඳව විධිමත් විමර්ශනයක් පවත්වා මා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම ඉහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් අපේක්ෂා කෙරේ.

මෙම අන්තර්වාර පාලන මණ්ඩලයට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අභිවෘද්ධිය සඳහා අවශ්‍ය වෙනත් කරුණු අතර, පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම පිණිස බලතල පවරා දෙනු ලැබේ.

1. විගණකාධිපති විසින් නිකුත් කරන ලද 2023.09.11 දිනැති විශේෂ විගණන වාර්තාවෙ හි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කොට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

2. අදාළ විමර්ශන කටයුතු සිදු කිරීම ස්වාධීනව විනිවිදභාවයකින් යුතුව විශ්වාසනීය ලෙස සිදුකරනු ලැබිය යුතු බැවින්, ඒ සඳහා අවකාශය ලබාදෙනු වස්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලියාපදිංචිය අත්හිටුවීම ක්‍රියාත්මකවන කාල පරිච්ඡේදය තුළ සහ අන්තර්වාර පාලන මණ්ඩලය විසින් සිදුකරන විමර්ෂණ කටයුතු අවසන් කොට ප්‍රතිකර්ම සලසන තෙක් ශ්‍රී ලංකා ක්‍රිකට් හි පරිපාලනය විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

3. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තුළ යථෝක්ත විගණන වාර්තාවේ සඳහන් දූෂණ, විෂමාචාර සහ අක්‍රමිකතා නැවත සිදු වීම වැළැක්වීම සඳහා අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ක්‍රියාමාර්ග සැකසීම.

**රොෂාන් රණසිංහ** (පා. ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 නොවැම්බර් මස 05 වැනි දින.

EOG 11 - 0042